# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,935/3 — 1970 දෙසැම්බර් 8 වැනි අඟහරුවාද — 1970.12.8

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී.—බී 20/61

**1961 අංක 28 දරන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනතේ**

**40 (1) වැනි වගන්තිය යටතේ කරන ආඥාවයි**

1963 අංක 5 දරන පනතින් සංශෝධිත, 1961 අංක 28 දරන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 40(1) වැනි වගන්තියෙන්, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති, ටිකිරි බණ්ඩා සුබසිංහ වන මම, මෙහි වූ උප ලේඛනයේ විස්තර කරනු ලබන දේපළ පිළිබඳ යෝජිත අත්කර ගැනීම මෙයින් අනුමත කරමි.

ටී. බී. සුබසිංහ,
කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 3 දින,
කොළඹ දී ය.

### උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොටගල නම් ග්‍රාමයෙහි පිහිටි වූටන් වතුයායේ කොටසක් වන, උතුරට වංගි ඔයෙන් ද, නැගෙනහිරට වූටන් වතුයායේ කොටසකින් ද, දකුණට හැරිංටන් වත්තට යන පාරෙන් ද, බස්නාහිරට ඒ. ටී. ඒ. සරනේලිස්ට අයිති ඉඩමෙන් ද මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ නැති, පර්චස් නැති, අක්කර හතරක් පමණ වූ සම්පූර්ණ බිම කොටස.

12–580


ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

926/7——ජේ 19257—11,050(70/12)